# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1918/19 - 2015 ජූනි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2015.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අංක. 56.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

12(2) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(2) වගන්තිය යටතේ බලතල ප්‍රකාරව ක්‍රියා කරමින්, කිසිදු වෙළෙන්දෙකු, ආහාර පාන සපයන්නකු, සැකසූ ආහාර සපයන්නකු හා / හෝ විශාල වශයෙන් ආහාර පාන සපයන්නකු හා / හෝ ස්ථානයෙන් පිටත ආහාර පාන සපයන්නකු ලෙස හෝ ව්‍යාපාරයක නිරතවන්නකු හෝ වෙනත් ඊට සමාන හෝ සම්බන්ධ ක්‍රියා / ක්‍රියාවන්හි නිරත වන්නකු ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙතින් යහපත් නිපැයුම් පරිචයන් (GMP) සඳහා වන කාර්යාවලි සහතිකයක් ලබා ඇත්නම් මිස එවන් ව්‍යාපාරයන් හී නියැලීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය 2017 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

**මෙයට අදාළ අර්ථනිරූපනයන්**

විශාල ලෙස ආහාර පාන සැපයීම (Mass Catering) - සමූහයකට ආහාර පිළියෙල කිරීම, ගබඩා කිරීම සහ / හෝ බෙදා හැරීම හා ආහාර පිරිනැමීම

පිට ස්ථානයක ආහාර පාන සැපයීම (Outdoor Catering) - තමාගේ ස්ථානය නොවන වෙනත් ස්ථානයක එකඟ වූ මිලකට හා ආහාර වට්ටෝරුවකට, එකඟවූ පිරිස් සංඛ්‍යාවකට, එකඟවූ වේලාවකදී හා ස්ථානයකදී ආහාර හා පානයන් පිරිනැමීමේ සේවාව.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2015 ජූනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

06 - 760


1A - PG 2504 — 206 (2015/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.